සන්නස
SANNASA



# සිහිනයක් වගේ....

22 වන කොටස

ස්නේහා බස් නැවතුමට එන විට උදෑසන පහ පසුවුණා පමණකි. ගමට යනවිට උදෙන්ම පිටත්වීම පහසු ය. පිටකොටුවෙන් උදේ බසයක නැගගත්විට දවල්ට අම්මාගේ බතේ රස බැලිය හැකි ය. ගම එනවා යයි ඊයේ කියූ නිසා තාත්තා මගට ඇවිත් ඉන්නටද ඉඩ ඇත. කරදරවන්නට එපා යයි කොයි තරම් කිව්වත් තාත්තා අහන්නේ නැත.

"පාරට එන එක මට මහ රාජකාරියක් නෙවෙයිනෙ දුවේ" තාත්තා කියන්නේ එහෙම ය. එපා කියා කීවද තාත්තා පාරට එන එකට ස්නේහා හිත යටින් කැමතිය.

පාන්දරින් වැඩට යන අය නිසා බස් නැවතුම පාලු නැත. ස්නේහා මෙතැනට එන සිටි තුන් හතර දෙනාගෙ පිරිස විනාඩි දහයක් යන්නට පෙරම දහ පහළොවක් බවට පත් විය. දන්නා අඳුණන මුහුණු ද ඒ අතර විය. බස් නැවතුමට ආ පළමු බසය ආවේම සෙනග පුරවාගෙන ය. හදිසිකාරයන්ට ඉඩ දී ස්නේහා පසෙකට වූවා ය. ඊළඟ බසයේ යා හැකි ය. රතු පැහැති ෆෝවීල් ඩ්‍රයිව් වාහනය ස්නේහා ඉදිරියේ නතර වුණේ බසය ඉදිරියට යනවාත් සමගය.

"නගින්න ස්නේහා" පහත් කළ වම් පස වීදුරුව තුළින් කිසිවකු කීවේ ය. අකලංකගේ කටහඬ ස්නේහා වහා හඳුණාගත්තා ය. නගිම්දෝ නොනගිම්දෝ යි සිතමින් ස්නේහා බලා සිටියා ය. වට පිට සිටියවුන්ගේ ඇස් තමන් දෙසට යොමුවෙමින් තිබෙනයුරු ස්නේහා දුටුවා ය. මේ ඇස් ඉදිරියේ අකලංක අපහසුවට පත් කරන්නට ඇයට නොසිතෙයි. ඈ වාහනය අසළට ඇවිද ගියාය.

## ස්නේහාගේත් අකලංකගේත් කතාව

"නගින්න.." ඔහු නැවත කීවේ ය.

"මං වැඩට නෙවෙයි යන්නෙ" ස්නේහා කීවා ය.

"මං දන්නවා.. නගින්න.. මිනිස්සු බලං ඉන්නවා" ඔහු කීවේ නොයිවසිල්ලෙනි.

මොහොතක් කල්පනා කළ ස්නේහා වාහනයට ගොඩ වූවා ය. ඔහු ඇගේ අතේ තිබූ ගමන් මල්ල පසුපස ආසනය මතට දැමුවේ ය. ඉන්පසු වාහනය සීරුවන් ඉදිරියට පැදෙව්වේ ය. ඇය දෙස හැරී බැලුවේ විනාඩියකට දෙකකට පසුව ය.

"සර් වැඩට යන ගමන්ද?" ස්නේහා අසන තෙක්ම ඔහු නිහඬව සිටියේ ය.

"නෑ" ඔහු එක වචනයකින් පිළිතුරු දුන්නේ ය.

"එහෙනං..?" ඈ ඇසුවා ය. ඇසුවායි කියනවාට වඩා ඉබේ ඇසුණා යයි කියන එක නැවැරදි ය.

"මං නුවර යනවා" ඔහු කීවේ ය.

"නුවර..?"

"ඔව්.. නුවර යනවා.. ස්නේහත් නුවර යන නිසා මං හිතුවා ඔයාට ලිෆ්ට් එකක් දෙන්න"

"ඔයා කොහොමද දන්නෙ මං නුවර යනවයි කියලා..?" ස්නේහා අසන්නේ පුදුමයෙනි.

"මං නොදන්නෙ මොනාද ස්නේහා.. මං හැමදේම දන්නවා" ඔහු සැහැල්ලුවෙන් සිනාසුණේ ය. කිවයුත්තක් සිතා ගත නොහැකිව ස්නේහා කල්පනාවට වැටී සිටියා ය.

"අනේ සර්.. ඔයා හොඳ ළමයා වගේ මාව කොටුවෙන් බස් එකට දාන්න.. මට බස් එකේ යන්න පුලුවන්" ස්නේහා බැගෑපත් වූවා ය. ඔහු පිලිතුරක් නොදුන්නේ ය.

සිරි පොදය අද උදෙන්ම ආරම්භ වී තිබේ. පසුගිය දින කීපයේ අත්දැකීම් කියන්නේ තව ටිකකින් ඒ සිරිපොදය මහ වැස්සක් වන බව ය.

"බලන්න.. මේ මහ වැස්සෙ ඔයාට බස් වල යන්න බෑ.. අනික මේ වාහනයක් නිකම් නුවර යන එකේ ඔයාට පොඩි උදව්වක් කළාට මොකක් වෙනවද?" ඔහු කීවේ ඉදිරිය බලාගත්වනම ය. "ස්නේහා.. මං ඔයාව පරිස්සමින් එක්කගෙන යන්නම්" ඔහු තවත් වාක්‍යයක් එකතු කළේ ය. එය කීවේ ඇය දෙස යාන්තමින් ඇස් කොණින් බලමින් ය.

ඇය යමක් කියනු ඇතැයි ඔහු බලාපොරොත්තු වූ නමුත් ස්නේහා නිහඬව ඉදිරිය බලා සිටියා ය.

"ඔයා උදේට කාල නැහැ නේද..?" ඔහු ටික වේලාවකට පසුව ඇසුවේ ය. උදේ කෑම ගැන ඇගේ සිතට ආවේ ඒ වේලාවේදී ය. නුවර බලසෙ කාතැනක හෝ කෑමට නතර කරන ගැනකින් බනිස් ගෙඩියක් හෝ මාලුපාන් ගෙඩියක් හෝ කන්නට සිතුවා විනා ඒ ගැන වැඩි දුර සිතන්නට ඈ නොවෙහෙසුණා ය. ඒස උළැස්ම වෙනස් කරන්නට සිදුව ඇති බව ඇයට වැටහුණේ ඔහුගේ ප්‍රශ්නයත් සමගින් ය.

"මං ඔයාටත් එක්ක කෑම ගෙනාවා.. අපේ ගෙදර මයුරි අම්මා උදේට රසට ආප්ප හදලා තිබුණා.. මං ගෙනාවා අපි දෙන්නටම ආප්පයි ලුණුමිරිසුයි" ඔහු කීවේ ය. මේ වැහි වෙලාවේ කටට සැර ලුණුමිරිස් සමග සුදු ආප්ප අපූරු කෑමකි. එහෙත් මේ හැසිරීම ස්නේහා කිසිදිනෙක අකලංක වෙතින් බලාපොරොත්තු නොවූ දෙයක් විය.

"අපි කොහෙ හරි නවත්තලා කමු.. මං වතුර බෝතල් දෙකකුත් දාගෙන ආවෙ.. ෆ්ලාස්ක් එකේ ප්ලේන් ටී තියෙනවා.. කාල බොමු" ඔහු සියල්ල මනා ලෙස සැළසුම් කර ඇති බවක් පෙනෙයි. ඇයට සිනාගියේ එනිසා ය.

"ඇයි හිනවෙන්නෙ..?" ඔහු ඇසුවේ ය.

"සර් මෙයිට ඉස්සෙල්ලත් මේ වගේ කෑම බීම දාගෙන නුවර ගිහින් තියෙනවද?"



ඈ ඇසුවා ය. ඔහු හැරී ඇය දෙස බැලුවේ ය.

"ඇත්තම කිව්වොත් මං මගේ ජීවිතේ පළමුවෙනි වතාවට මේ විදිහට යන්නෙ.. මේක මරු.. මං ආසයි මේ විදිහට" ඔහු කීවේය. "මං කවදාවත් කිසිම දෙයක් කලින් සූදානම් වෙලා කරපු කෙනෙක් නෙවෙයි ස්නේහා.. ගමනක් යන්න ඕනෙ වුණාම කා එකට නැග්ගා.. ගියා.. අහුවෙන තැනකින් කෑවා.. අහුවෙන තැනක නිදාගත්තා.. ඒත් දැන් මං වෙනස්.. මං දැන් හිතන්නෙ වෙනස් විදිහට.. ජීවිතේ වෙනස් කරගන්න මට ඕනෙ වුණා" ඔහු කීවේ ය. ඒ හඬෙහි ගැබ්ව තිබූ අවංක බවක් ස්නේහාට දැනුණි. මුල්ම දා රෝහලේදී දුටු දඩබ්බරයා සැඟව ගොස් ඇතුවා සේ ය. "ජීවිතේ එක දවසක මටම හිතුණා වෙනස් වෙන්න ඕනෙ කියලා"

ඒ කවදාදැයි අසන්නට ස්නේහා නොසිතුවා ය. ඔහු දෙන පිළිතුර ඇය දනියි. එය නැවත නැවත අසන්නට අසන්නට සිතට ඇතිවන්නේ අනියත බියකි. ඔහු තමා සමග යන්නට හදන ගමන ඇගේ සිතේ සතුටකට වඩා ඇති කරන්නේ බියකි.

"ජීවිතේ වෙනස් කරගන්න මං කැමතියි ස්නේහා.. ඒකට මට පොඩිම පොඩි සහයෝගයක් දෙන්න.." ඔහු ටික වේලාවකට පසුව කීවේ ය.

මතු සම්බන්ධයි

